# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.08.18

වර්ෂ 2021 ක් වූ අගෝස්තු මස 18 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අගෝස්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
12. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
13. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-**

**01. 2021-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

2021-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, නැත්නම් 2021-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2021-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මහා සභා රැස්වීමේ වාර්තාව සඳහා සංශෝධන ඉදිරිපත් නොවූ අතර, 2021-07-20 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

අද දිනයේදී න්‍යායපත්‍රානුකූලව මහා සභා රැස්වීමේ කටයුතු කරගෙන යාම සඳහා සහයෝගය ලබා දෙන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

කලේගාන පොළ පිහිටි භූමියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මාතර උදය කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ටෙන්ඩරය පිරිනමන ලද බවත්, සිට්ටුස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ඉදිරිපත් වූ ටෙන්ඩර් තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමුකර ඇති බවත්, කලේගාන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව අවශ්‍ය සැලසුම් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත

<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත

<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>

**01.** හිටපු ගරු මන්ත්‍රී කියාස් මැතිතුමාගේ සභික ධූරය අහිමිවීම නිසා තාක්ෂණික සේවා කමිටුවේ ඇති වූ පුරප්පාඩුව සඳහා ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා පත්කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** මවුන්ට් ප්ලසන්ට් වත්ත, ජන උදාන ගම්මානයේ ප්‍රධාන මාර්ගයේ පැති කාණු සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** කැබලි කර විකුණන ඉඩම්වල (වෙන්දේසි ඉඩම්) ඇතුළත මාර්ග, කාණු සහ පැති බැම් ඉදිකිරීම සම්බන්ධව 2020-11-17 දින පැවති මහා සභා රැස්වීමේදී ලබා ගත් ඉ.06 අංක දරණ සභා තීරණය අවලංගු කිරීමටත්, කැබලි කර විකුණන ඉඩම්වල (වෙන්දේසි ඉඩම්) ඇතුළත මාර්ග, කාණු සහ පැති බැම් ඉදිකිරීම අදාළ ආයතනයන් විසින් හෝ පුද්ගලයන් විසින් හෝ සිදුකිරීමේදී අප ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් වෙන්දේසි ඉඩම් වල ඇතුළත මාර්ග, කාණු සහ පැති බැම් ඉදිකිරීම්වල ප්‍රමිතිය සම්බන්ධව ඇති ගැටළු පිළිබඳව සභාව දැනුවත් කරන ලද අතර මෙම ගැටළු සම්බන්ධ වගකීම මෙම ඉදිකිරීම්වල අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබන නිලධාරීන් විසින් පෞද්ගලිකව දැරිය යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණා කාරණා ගැන සහ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආකාරය සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් වෙන්දේසි ඉඩම්වල යටිතල පහසුකම් ඉක්මනින් විනාශයට පත්වීම පිළිබඳව අදහස් දැක්වීමෙන් අනතුරුව මෙම ගැටළු අවම කර ගැනීම සඳහා අදාළ වෙන්දේසි සමාගම් වෙත ගිවිසුමක් මගින් කොන්දේසි පැනවීම සුදුසු බවත් අදාළ සංවර්ධන ක්‍රියාවලියන් අධීක්ෂණ කටයුතු නිලධාරීන් ලවා නිසියාකාරව සිදුකළ යුතු බවටත් ප්‍රකාශ කරන ලදී.

<u>(ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් තරංගා ලැන්ඩ් සේල් ආයතනය මගින් හිරිඹුර පැතුම් උයන නමින් වෙන්දේසි කරන ලද ඉඩමේ සංවර්ධන කටයුතු වල ඇති අඩුපාඩු පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් අඩුපාඩු සහිතව වෙන්දේසි කරන ලද ඉඩම් පිළිබඳව උදාහරණ දක්වමින් ඉඩම් වෙන්දේසි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරනු ලබන අතපසුවීම් ගැන සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් වෙන්දේසි ඉඩම්වල අඩුපාඩු සහිත සංවර්ධන කටයුතු සම්පූර්ණ කරන තෙක් වෙනත් වෙන්දේසි ඉඩම් සඳහා අදාළ ආයතනයන් වෙත අනුමැතිය ලබා නොදී සිටීමට හැකියාවක් නොමැති බවට නාගරික සංවර්ධන අධිකාරිය මගින් දන්වා ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් වෙන්දේසි ඉඩම්වල යටිතල පහසුකම් වල ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා නීත්‍යානුකූල බලපෑමක් අදාළ ආයතන වෙත කළ යුතු බවට සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් තරංගා ලෑන්ඩ් සේල් ආයතනය මගින් බලහත්කාරයෙන් අවිධිමත් ලෙස වෙන්දේසි ඉඩම්වල සංවර්ධන කටයුතු සිදුකරන බැවින් අදාළ සංවර්ධන කටයුතු නිසියාකරව සිදු නොකර ඒවා වෙත අනුමැතිය ලබාදීම සම්බන්ධව සිය විරෝධතාවය ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් වෙන්දේසි ඉඩම්වල සංවර්ධන කටයුතු නිසියාකරව සිදුකරනවා නම් ඒ සඳහා සභාවේ සහයෝගය ලබාදිය හැකි බවට සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** කලේගාන පොළ භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල මිල ගණන් කැඳවා කඩා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් අදාළ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ අබලි ද්‍රව්‍ය පියදිගම සන්බීම් පාර්ක් ඉඩම ගොඩකිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා ලෙස ඉල්ලීම් කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා අදාළ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ කටයුතු සභාවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සභාවේ වාහන සහ සේවකයන් මගින් සිදුකිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදාළ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ කටයුතු සභාවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සභාවේ වාහන සහ සේවකයන් මගින් සිදුකිරීමේදී පැන නගින ප්‍රායෝගික ගැටළු පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ''කලේගාන පොළ භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල, ගස් සහ භූමියේ ඇති අනෙකුත් සියළු දේ මිල ගණන් කැඳවා ඉවත් කිරීමට" ලෙස ඉහත යෝජනාව සඳහා සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් එම සංශෝධනය ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අකාරය සම්බන්ධ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** කලේගාන සති පොළ ලැන්දෑව හන්දියේ ඇති මහාබෝධි සමාගමට අයත් ඉඩමට ගෙනයාම සඳහා මහාබෝධි සමාගමේ එකඟතාවය ඇතුව සභාවේ නිලධාරීන්, සේවකයන්, යන්ත්‍ර උපකරණ සහ සභා අරමුදල් යොදවා එම ඉඩම සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් මහාබෝධි සමාගමට අයත් මෙම ඉඩම විවිධ පාර්ශව විසින් අත්පත්කරගෙන අනවසර ඉදිකිරීම් සිදු කරමින් පවතින බැවින් මෙම ඉඩම සභාවට අත්පත්කර ගැනීම සඳහා ඉක්මනින් මැදිහත්වන ලෙස ඉල්ලීම් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මහාබෝධි සමාගමට අයත් මෙම ඉඩම විවිධ පාර්ශව විසින් අත්පත්කර ගනිමින් සිටින බැවින් එම ඉඩම සභාවට අත්පත්කරගෙන සභාවේ වත්කමක් කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** අප ප්‍රාදේශීය සභාවට අයත් සහ අප ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විඳිනු ලබන ලබුදූව නිල සෙවණ සේවා පියස හා සුසාන භූමිය පිහිටි ඉඩමේ කොන්ක්‍රීට් කණු යොදා කටු කම්බි ගසා මායිම් තහවුරු කර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් මෙම යෝජනාව මීට පෙර ද ඉදිරිපත් වී ඇති බවත්, විවිධ ඉදිකිරීම් සඳහා එම භූමිය යෝජනා වූ බවත්, මෙම ඉඩම පමණක් නොව ගැමුණු මාවතේ සභාව සතු ඉඩම ඇතුළු අනෙකුත් ඉඩම් සඳහාද මෙය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**07.** හිරිඹුරගම ප්‍රජාශාලවේ වහල අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් හිරිඹුරගම ප්‍රජාශාලාව පිහිටි භූමියේ අයිතිය සභාව වෙත පවරා ඇති බවට තහවුරු කර ගැනීමෙන් පසු අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට සභාව දැනුවත් කරන ලදී.

<u>(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** අප ප්‍රාදේශීය සභාවට නිවාස සැලසුමක් අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ ද මාස දෙකකට අධික කාලයක් ඒ සඳහා අනුමැතිය ලබාදීමට ගතවන බැවින් මේ පිළිබඳව කඩිනමන් විසඳුමක් ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදාළ ගැටළුව කොරෝනා වෛරසය ව්‍යාප්තියත් සමඟ පැන නැගී ඇති බවත්, මේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමාද දැනුවත් කර ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් නැකැත් සම්බන්ධව ඇති ගැටළු පවතින බැවින් ඒ සඳහා ජනතාව වෙත සහනයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** පැල්පොලවත්ත පැති කාණුව අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගනිමින් පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් පැල්පොලවත්ත ප්‍රදේශයේ කාණුවක පස් ගොඩගසා ඇති බවට මාස දෙකක පමණ කාලයක සිට ප්‍රදේශවාසීන් විසින් තමා දැනුවත් කරන බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් කාණු කැපීමේදී එක්රැස් වූ පස් එලෙස ගොඩගසා ඇති බවත්, එම පස් ජේ.සී.බී යන්ත්‍රය යොදා ඉවත් කිරීමට මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** අලුත්වත්ත, අතුරු මාර්ගය (පැල්පොලවත්ත පළමු පටුමග) සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**11.** බෝපෙ මුත්තෙට්ටුවගේ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** බෝපෙ උතුර, එගොඩකනත්තේ පිහිටි ප්‍රජා ශාලාවේ ප්‍රවේශය පඩිපෙලක් අකාරයට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉදිරියේදී ප්‍රධාන සංවර්ධන කටයුතු දෙකක් සඳහා සභා අරමුදල් කෝටි 15ක් පමණ වියදම් වන බැවින් සංවර්ධන කටයුතු වෙනත් ක්‍රම මගින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන බවට සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් මෙම යෝජනාවට අදාළ සංවර්ධන කාර්යය සඳහා රු.10,000.00 කට අඩු මුදලක් වැයවන බැවින් එය ඉටුකර දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** වාළුකාරාම පන්සල අසළින් ඇති හරස් මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** පියදිගම, කිංග්ස්කෝට් මාර්ගයේ චන්ද්‍රසිරි මහතාගේ නිවස අසළින් ඇති ඇළ මාර්ගය අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගනිමින් සුද්ධ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**15.** සෞඛ්‍ය සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සේවකයන් පස් දෙනෙකු බඳවා ගැනීම සඳහා ඉල්ලීම් කොට ඇති නමුත් ඒ සඳහා තවම අනුමැතිය හිමි නොවූ බවත්, කොරෝනා වෛරසය ව්‍යාප්තිය හමුවේ විෂබීජහරණ කටයුතු වලදී සහ එන්නත්කරණ කටයුතු වලදී පැන නැගී ඇති ප්‍රායෝගික ගැටළු ගැන සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය, ගරු මන්ත්‍රී කේ.යූ.ජී.

යසරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් මහජන නියෝජිතවරුන් ලෙස ඵන්නත්කරණයේදී මුහුණ පෑමට සිදුවූ ප්‍රායෝගික ගැටළු පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** වටරැක බටහිර, ගොඩගමගේ වත්ත පාරේ ඇති කාණුව අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගනිමින් සුද්ධ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**17.** වටරැක, උස් ඒදණ්ඩ පාලම අසළ කුණු කසළ සහ අපද්‍රව්‍ය බැහැරකර ඇති බැවින් එම කුණු කසළ සහ අපද්‍රව්‍ය අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා ඉවත් කර එම ස්ථානයේ කුණු දැමීම තහනම් යැයි පුවරුවක් සවිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල්තබන ලදී.)**

<u>(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**18.** හොරයිසන් වීව් වෙන්දේසි ඉඩමේ සභාව සතු ඉඩම් කැබැල්ලේ තේ හෝ කුරුඳු බෝග වගා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් '' හොරයිසන් වීව් වෙන්දේසි ඉඩමේ සභාව සතු ඉඩම් කැබැල්ලේ වන වගාවක් සිදු කිරීමට " ලෙස ඉහත යෝජනාව සඳහා සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් එම සංශෝධනය ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් මෙම ඉඩම පොදු කටයුතු සඳහා වෙන්කර ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් අදාළ ඉඩම බෑවුම් සහගතව පිහිටි ඉඩමක් බැවින් මෙය වගාවකට සුදුසු බවට සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**19.** මාම්පිටිය, කහගලවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**20.** වී.සී පාරේ සුමතිපාල මහතාගේ නිවස ඇතුළු නිවාස හතකට යන පාර සභාවට අත්පත්කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මැනුම් කටයුතු සිදුකර දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**21.** බඩනැලගොඩ වත්ත පාර සභාවට අත්පත්කරගෙන මැනුම් කටයුතු සිදු කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**22.** කලේගාන, වී.සී පාරේ සභාව සතු භූමියේ සාදන ලද ගොඩනැගිල්ලේ ලී කැටයම් මධ්‍යස්ථානය ශිල්ප සංවර්ධන සමිතියට පවරා දීමට යෝජනා කරමි.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදාළ ගොඩනැගිල්ල සභාව සතු වත්කමක් බවත්, එය බදු දීමක් මිස පවරා දීමක් සිදු කිරීමට නොහැකි බවටත් අදාළ කඩකාමරය සඳහා මාසික බදු කුලිය ලෙස රු.13,500.00ක මුදලක් අයකරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව දැනුම් දී ඇති බවට සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් අදාළ සමිතියට එම බදු මුදල ගෙවීමට ආදායමක් නොමැති බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදාළ සමිතියට මේ සම්බන්ධව සභාව වෙතින් ඉල්ලීමක් කරන ලෙස දැනුම් දෙන ලදී.

ඉහත යෝජනාව ස්ථිර කිරීමක් සිදු නොවූ බැවින් සභා සම්මතවීම සිදු නොවීය.

**23.** කලේගාන, වී.සී පාරේ සභාව සතු භූමියේ සාදන ලද ගොඩනැගිල්ලේ ලී කැටයම්කරුවන්ගේ කඩ කාමරයෙන් සහ අනෙකුත් රජයේ නිලධාරින්ගෙන් අප ප්‍රාදේශීය සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා**

**24.** කහඳූවවත්ත, කොහොඹන්වත්ත, මහේෂ් මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා**

**25.** මාම්පිටිය, මහවත්ත මාර්ගයේ පිවිසුම ඉදිරිපිට පවතින අනවසර ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග සභාවට පැහැදිලි කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මාම්පිටිය, මහවත්ත මාර්ගයේ පිවිසුම ඉදිරිපිට පවතින අනවසර ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ අනවසර ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා ඇති නීතිමය බාධාවන් පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**26.** කාලීන අවශ්‍යතාවයක්ව පවතින කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා සිට්ට්‍රස් වතු යායෙන් බිම් කොටසක් ලබාගෙන කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ගාල්ල මහ නගර සභාව විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත කවෂිමා යන්ත්‍රය සඳහා දෛනිකව දිරාපත්වන කසළ ටොන් පහක් ලබාදීමට එකඟතාවය පළ කොට ඇති බවත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීමේදී මොන්රෝවියාවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ගෙවන මුදල ඉතිරිවන බවටත් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**27.** කසළ කළමනාකරණයට ප්‍රතිකර්මයක් ලෙස කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා බල ප්‍රදේශයේ නිවැසියන් හට කොම්පෝස්ට් බඳුන් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මීට පෙර ක්‍රියාත්මක කරන ලද කොම්පොස්ට් බඳුන් ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ලද ගැටළු පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් නිවාස සැලසුම් අනුමත කිරීමේදී කොම්පෝස්ට් බඳුන් තිබීමේ කොන්දේසිය අනිවාර්ය කිරීමේ වැදගත්කම සහ වෙන්දේසි ඉඩම්වල ජනතාව වෙත කොම්පෝස්ට් බඳුන් ලබාදීමේ වැදගත්කම පිළිබඳව අදහස් දක්වන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද කොම්පෝස්ට් පොහොර නොමිලේ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියත්මක නොවීම පිළිබඳව විමසීම් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කොම්පෝස්ට් පොහොර නොමිලේ ලබාදීමේ ව්‍යාපෘතිය ප්‍රමාදවීමට හේතු වූ ගැටළු පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u> ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව** :-

**I.** 2021-07-29 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2021-08-06 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

I. 2021-08-06 දින පැවති තාක්ෂණික සේවා සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව** ඃ- නැත

**04. පරිසරය සහ පහසුකම් කමිටුව** ඃ- නැත

**(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2021 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2021 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2021 වර්ෂයේ ජූලි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ- නැත**

**(ඍ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2021 වර්ෂයේ අගෝස්තු මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට කරන ලද යෝජනා සම්බන්ධව අදාළ ආයතනයන් දැනුවත් කිරීමේදී යෝජනාව ඉදිරිපත් කරන ලද ගරු මන්ත්‍රීවරයාට එම ලිපියේ පිටපතක් එවීමේ වැදගත්කම පිළිබඳව සභාව දැනුවත් කරන ලදී. මීට අමතරව වෙන්දේසි ඉඩම් සඳහා සංවර්ධන බලපත්‍රය ලබා දෙන අවස්ථාවේ අනුමැතිය ලැබෙන තුරු එම ඉඩම් කැබලි විකිණීම සිදු නොකරන ලෙස අදාළ සමාගම් දැනුවත් කරන ලෙසත්, අනවසර ඉදිකිරීම් සඳහා නඩු දැමීමේදී විශාල ඉදිකිරීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

බටුවන්තුඩාව පන්සල ඉදිරිපිට ඇති වෙන්දේසි ඉඩමේ සිදු කරන ලද අවිධිමත් ඉදිකිරීම් පිළිබඳව සහ කඳු සහිත වෙන්දේසි ඉඩම්වල නිවාස ඉදිකිරීමේදී එන්.බී.ආර්.ඕ සහතිකය ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලද අතර නාගරික සංවර්ධන

අධිකාරියේ අත්තනෝමතික ක්‍රියාවලට එරෙහිව නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපිට පැයක සංකේත උද්ඝෝෂණයක් කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන ලදී.

(ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ගොඩකන්ද - හෝළුවාගොඩ මාර්ගය මීපාවල හේමාලෝක නාහිමි මාවත ලෙස නම් කිරීමේ යෝජනාව සම්බන්ධව මේ වන විට ඇති ප්‍රගතිය පිළබඳව සහ ගිංතොට තුනී ලෑලි සංස්ථාව පිහිටි ඉඩම සභාවට අත්පත් කරගැනීමේ යෝජනාව සම්බන්ධව මේ වන විට ඇති ප්‍රගතිය පිළබඳව විමසීම් කරන ලදී.

ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් කපුහෙම්පල හිනිදුම්ගොඩ ප්‍රදේශයේ සිදුකරනු ලබන වෙන්දේසි ඉඩමේ ඇති අඩුපාඩුකම් පෙන්වා දීමෙන් අනතුරුව එම ඉඩම වෙන්දේසි කිරීම නිසා ප්‍රදේශවාසීන් මුහුණ දී ඇති ගැටළු සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් උප කාර්යාලයේ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා සභාව මගින් ප්‍රවාහන පහසුකම් සලසන ලෙස ඉල්ලීම් කරන ලද අතර වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමේ කටයුත්ත පිළිබඳව විමසීම් කරන ලදී. මීට අමතරව සභාව සතු මාර්ගයක් වන ටැක්කියාවත්ත - වැරැල්ලාන මාර්ගය සංවර්ධන කටයුතු පිළිබඳව ඇති ගැටළු සම්බන්ධව සහ බෝගහවෙල්ල මාර්ගය සංවර්ධනය කටයුතු පිළිබඳව ඇති ගැටළු සම්බන්ධව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

අදාළ මාර්ගයන් සභාව සතු මාර්ගයන් බැවින් එම මාර්ග සංවර්ධන කටයුතුවලදී අප සභාවේ තාක්ෂණ නිලධාරීන් අවධානයෙන් පසුවන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

අදාළ මාර්ගයන්වල සංවර්ධන කටයුතු අවසන් නැති බවත් කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා සංවර්ධන කටයුතුවල යම් ප්‍රමාදයක් දක්නට ලැබෙන බව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් මුලන ජනපදයේ සුසාන භූමිය සංවර්ධනය කරදෙන ලෙස සහ ප්‍රාදේශීය සභාවේ දුරකථන නාමාවලියක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදාළ යෝජනා මීළඟ මහා සභා රැස්වීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ලබා දෙන ලෙස දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් මුලන ජනපදයේ සුසාන භූමිය සංවර්ධනය කිරීමේ වැදගත්කම පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් සේරියගොඩ - ඔබදෙණිය මාර්ගය ග්‍රේස් පතිරණ මාවත ලෙස නම් කිරීමේ යෝජනාව සම්බන්ධව මේ වන විට ඇති ප්‍රගතිය පිළබඳව විමසීම් කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා 2021 වර්ෂය සඳහා වූ අයවැයට තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඇතුළත් නොකර 2022 වර්ෂය සඳහා වූ අයවැයට යෝජනා ඉල්ලා සිටීම සම්බන්ධව සිය විරෝධතාවය ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය වෙත සභාවට සහභාගී වීමට නොහැකි බවට දන්වා ඇති බැවින් නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු**

01. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2021-09-15 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.